ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී ( ගෞරව) උපාධි පාඨමාලාව - 2023/2024

04 වන මට්ටම

LLU 4607 ගිවිසුම් නීතිය

අවසාන විභාග පරීක්ෂණය

කාලය පැය 03 යි.

---

දිනය : 2025 මැයි මස 11 වේලාව: ප.ව 1.30 - ප.ව 4.30

---

මුළු ප්‍රශ්න සංඛ්‍යාව 08 කි .

ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

සෑම ප්‍රශ්නයක් සඳහාම ලකුණු 20 ක් බැගින් පිරිනැමේ.

**01.** ටෙක්නෝවා (පුද්ගලික) සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී චමීර, රජයේ පුළුල් තොරතුරු තාක්ෂණ ව්‍යාපෘතියක් සඳහා ලංසුවක් සූදානම් කරමින් සිටී. ටෙන්ඩර් අවශ්‍යතා සපුරාලීම සඳහා, ඔහු ක්වොන්ටම්-එක්ස් සේවාදායක ඒකකයක් (Quantum-X Server Unit) මිලදී ගැනීම සඳහා ටෝකි සැපයුම්කරුවන් (පුද්ගලික) සමාගම (Toki Suppliers (Pvt) Ltd) හා සම්බන්ධ විය. ඔහු ටෝකි හි ජ්‍යෙෂ්ඨ විකුණුම් විධායක නිලධාරියෙකු වන ජෙගන් සමඟ දුරකථනයෙන් මිල සහ බෙදා හැරීම පිළිබඳ විස්තර සාකච්ඡා කළ අතර එකී ඇමතුමෙන් ටික කලකට පසු, ජෙගන් මෙසේ සඳහන් කරමින් විද්‍යුත් තැපැල් පණිවුඩයක් (e- mail) එවයි:

"අපගේ සාකච්ඡාවට අනුව, ක්වොන්ටම්-එක්ස් සේවාදායක ඒකකය සඳහා ඔබගේ ඇණවුම රු මිලියන 4.5 කට අප විසින් තහවුරු කරන අතර බෙදා හැරීම සති 3 ක් ඇතුළත සිදු කෙරේ. කරුණාකර අමුණා ඇති අපගේ සම්මත නියමයන් සහ කොන්දේසි බලන්න. තහවුරු කිරීම හෝ කිසියම් ගැටළුවක් ඇත්නම් කරුණාකර ආපසු දන්වන්න."

චමීර ඊමේල් පණිවුඩයේ අන්තර්ගතය කියවන නමුත් අමුණා ඇති නියමයන් සහ කොන්දේසි විවෘත නොකරයි. ඔහු එදිනම පිළිතුරු දෙමින් පවසන්නේ "ස්තූතියි ජෙගන් - දීමනාව ගැන සතුටුයි. කරුණාකර ඉදිරියට යන්න. මම ඉක්මනින් විස්තර සහ කාලසීමා එවන්නම්." යනුවෙනි. චමීර විසින් වැඩිදුර ක්‍රියාමාර්ගයක් ගනු නොලැබෙන අතර දින දහයකට පසු, වෙනත් වෙළෙන්දෙකුගෙන් වඩාත් ආකර්ශනීය දීමනාවක් ලැබීමෙන් පසු, ඔහු ජෙගන්ට දැනුම් දෙන්නේ ඇණවුම සමඟ ඉදිරියට නොයන බවයි. ටෝකි සැපයුම්කරුවන් අවධාරණය කරන්නේ ගිවිසුමක් සකස් කර ඇති බවත්, සැපයුම්කරු විධිවිධාන සකස් කිරීමේදී ඔවුන් ගිවිසුම මත විශ්වාසය තබා ඇති බවත්ය. චමීර කියා සිටින්නේ සාකච්ඡා මූලික බවත්, කිසිදු ගිවිසුමක් අවසන් කර නොමැති බවත්, සම්මත නියමයන් පිළිබඳව තමා කිසි විටෙකත් සම්පූර්ණයෙන් දැන නොසිටි බවත්ය.

චමීර සහ ටෝකි සැපයුම්කරුවන් අතර වලංගු සහ බැඳීම් සහිත ගිවිසුමක් ඇති කර ගත්තේද යන්න අදාළ නඩු තීන්දු සහ නීති මූලධර්ම සමඟ විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20 යි )

**02.** චරිතා සහ නිරෝෂිකා වසර ගණනාවක් පුරා එකට ව්‍යාපාර කරමින් සිටින අතර ඔවුන්ගේ නිතිපතා ගනුදෙනුවල කොටසක් ලෙස, චරිතා තක්කාලි පේස්ට් බැරල් දහයක් නිරෝෂිකාගේ ගබඩාවට ගබඩා කිරීම සඳහා භාර දුන්නාය. දින කිහිපයකට පසු, සුපුරුදු පරිදි, නිරෝෂිකා භාරදීම පිළිගනිමින් රිසිට්පතක් චරිතා වෙත නිකුත් කළාය. රිසිට්පතේ ඉදිරිපස "පසුපස නියමයන් සහ කොන්දේසි" සඳහා යොමුවක් ඇතුළත් වූ අතර, පිටුපස පහත පරිදි මුද්‍රිත වගන්තියක් සටහන් කර තිබුණි:

"ගබඩාවේ හෝ එහි සේවකයින්ගේ නොසැලකිලිමත්කම, වැරදි ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් හේතුවෙන් සිදුවන භාණ්ඩ අලාභයක්, හානියක් හෝ පිරිහීමක් සඳහා ගබඩාව වගකිව යුතු නොවේ."

නිරෝෂිකාගේ සේවකයෙකු විසින් නොසැලකිලිමත් ලෙස හැසිරවීම හේතුවෙන්, බැරල් අවශ්‍ය පරිදි සිසිල් වියළි ස්ථානයක ගබඩා කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, අන්තර්ගතය නරක් වී විකිණීමට නුසුදුසු වූ අතර චරිතා විසින් නිරෝෂිකාට එරෙහිව පාඩුව සඳහා වන්දි ඉල්ලා නඩු පැවරන ලදී. නිරෝෂිකා වගකීම් මුක්ත කිරීමේ වගන්තිය (exemption clause) මත විශ්වාසය තබන අතර එකී නියමයන් මගින් චරිතා බැඳී ඇති බවට තර්ක කරයි.

අදාළ අධිකරණ පූර්වාදර්ශ මත පදනම්ව නිරෝෂිකාට නෛතික උපදෙස් ලබා දෙන්න.

**( ලකුණු 20 යි )**

**03.** පහත සඳහන් සිදුවීම් වලින් ඕනෑම දෙකක් ( 02 ) ගිවිසුමක් අවසානයට පත් කරන ආකාරය පැහැදිලි කරන්න.

( අ ) ඉටුකිරීම

( ආ ) එකඟවීම

( ඇ ) ගිවිසුම් කඩ කිරීම

**( 02 x 10 = ලකුණු 20 යි )**

**04.** 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ අඩංගු ගිවිසුම් ඇති විය හැකි ආකාරයන් දක්වන නීතිමය ප්‍රතිපාදනයන් විශ්ලේෂණය කොට , ගිවිසුම් ඇතිවීමේ සාම්ප්‍රදායික මූලධර්මයන් එමගින් වෙනස් වී ඇති ආකාරය පැහැදිලි කරන්න. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන අදාළ කර ගත යුතුය.

**( ලකුණු 20 යි )**

**05.** *The Siboen and the Sibotre [1976] 1 Lloyd's Rep 293* හිදී **Kerr** විනිසුරුවරයා ප්‍රකාශ කල පරිදි 'උත්තර්ජනයේදී අවධානය යොමු වන්නේ හුදෙක් තර්ජනයට ලක්ව තිබුණාද යන්නට නොව එම තර්ජනය හේතුවෙන් නිදහසේ තීරණයක් ගත නොහැකිව සැබෑ වශයෙන් එකග වීමක් නොවී තිබුණාද යන්න වේ.'

උත්තර්ජනයට අදාළ නීතිය සම්බන්ධයෙන් වන නූතන වර්ධනයන් අනුසාරයෙන් මෙම ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න .

**( ලකුණු 20 යි )**

**06.** දක්ෂ ඔරලෝසු සාදන්නෙකු වන ඉදුනිල් මුණගැසෙන බන්දු , ව්‍යාජ වෙළඳනාම සහිත ඔරලෝසු නිෂ්පාදනය කර විකිණීමේ ව්‍යාපාරයක් පිහිටුවීමට යෝජනා කරයි, ඉදුනිල් මුලදී දෙගිඩියාවකින් පසු වූවත් බන්දු ඔහුට සහතික වන්නේ , " හැමෝම ඒක කරනවා " සහ නීතිමය ගැටළු අවම වන පරිදි ව්‍යාපාරය ආරම්භ කරන්නේ කෙසේදැයි තමා දන්නා බවත්ය. ඔවුන් දෙදෙනා හවුල් ව්‍යාපාරයක් ගොඩනගා ලාභය සමානව බෙදීමට එකග වේ. තවද ව්‍යාපාරය සදහා අවශ්‍ය විශේෂිත මෙවලම් මිළදී ගැනීම සඳහා පුද්ගලික ණය ලබා දෙන්නෙකු වන සිතාරාගෙන් රුපියල් මිලියනයක්ද ණයට ගනී. අදාළ ණය මුදලේ අපේක්ෂිත භාවිතය පිළිබඳව සිතාරා හොඳින් දැනුවත්ය.

මාස කිහිපයකින් ව්‍යාපාරය දියුණු වූ අතර සැලකිය යුතු ලාභයක් ලබා ගැනීමට හැකිවිය. කෙසේ වෙතත් එකී ලාභය බන්දු විසින් අක් වෙරළ ගිණුමට යොමු කර ඇති බව ඉදුනිල් දැනගත් විගස දෙපාර්ශවය අතර අර්බුධයක් ඇතිවිය.

ඉදුනිල් ඔහුට හිමි ලාභාංශ කොටස බන්දුගෙන් ඉල්ලා සිටින විට බන්දු එය ලබාදීම ප්‍රතික්ෂේප කල අතර , ව්‍යාපාරයට ව්‍යාජ භාණ්ඩ විකිණීම සම්බන්ධ වන බැවින් එය සාපරාධී වරදක් වන බවත් දෙදෙනා අතර කිසිදු ගිවිසුමක් ඉදුනිල්ට බලාත්මක කල නොහැකි බවද දක්වයි.

ඉහත ආරවුලෙන් පසුව ඉදුනිල් සහ බන්දු අතර හවුල් ව්‍යාපාරය අවසන් කළ අතර සිතාරාගේ ණය ගෙවීමද නතර කරයි. සිතාරා ඔවුන්ට එරෙහිව නීතිමය කටයුතු ආරම්භ කරයි.

ඉහත සිදුවීම් වලට අදාලවන නීතිමය ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න. අදාල නෛතික මූලධර්මයන් සහ නඩු තීන්දු නීතිය විශ්ලේෂණයට සහාය කර ගන්න.

**( ලකුණු 20 යි )**

**07. අ)** බාල වයස්කරුවන්ට, එනම් වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින්ට කිසි විටෙකත් බලාත්මක කළ හැකි ගිවිසුම්වලට එළඹිය නොහැකිද? ස්ථාපිත නීති මූලධර්ම භාවිතා කරමින් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**(ලකුණු 08 යි )**

**ආ)** චතුර සහන්ගෙන් ඉඩමක් මිලදී ගැනීමට කැමති වන අතර සාකච්ඡා අතරතුර, සහන් පවසන්නේ ඉඩම "සියලු සීමාකාරී ගිවිසුම් වලින් නිදහස්" බවයි. චතුර මෙම තොරතුරු ස්වාධීනව සත්‍යාපනය නොකරන අතර පසුව, විකිණීම අවසන් වූ පසු, ඉඩම ඇත්ත වශයෙන්ම, මහල් දෙකකට වඩා ඉහළින් ඉදිකිරීම් තහනම් කරන සීමාකාරී ගිවිසුමකට යටත් වන බවත්, එය ඔහුගේ සැලසුම්ගත සංවර්ධනයට බරපතල ලෙස බලපාන බවත් චතුර හට දැන ගැනීමට ලැබේ.

සහන් තර්ක කරන්නේ ඔහු බොරු නොකියූ බවත්, හිටපු හිමිකරුවෙකුගෙන් ඇසූ දේ මත පදනම්ව කිසිදු සීමාවක් නොමැති බවට ඔහු උපකල්පනය කළ බවයි.

අවනිදේශනය යටතේ ඔහුට පිළියමක් තිබේදැයි චතුරට උපදෙස් දෙන්න.

**(ලකුණු 12)**

**( 08 + 12 = ලකුණු 20 යි )**

**08. අ)** චිත්‍ර වෙළෙන්දෙකු වන විමුක්ති, ඉසුරුගෙන් මූර්තියක් මිලදී ගැනීමට එකඟ වන අතර, ඔවුන්ගේ සාකච්ඡා සහ ලියකියවිලි මත පදනම්ව, මූර්තිය 19 වන සියවසේ ප්‍රසිද්ධ කලාකරුවෙකු වන ජේ.ආර්. ද සිල්වාගේ මුල් කෘතියක් බව විමුක්ති විශ්වාස කරයි. ඉසුරු කලාකරුවාගේ නම පැහැදිලිව සඳහන් නොකර මූර්තිය විමුක්තිට ප්‍රදර්ශනයට ඉදිරිපත් කරයි. දෙපාර්ශ්වයම මූර්තිය විකිණීමට ලිඛිත ගිවිසුමක් අත්සන් කරන ලද අතර එහි සඳහන් වූයේ "කිරිගරුඬ මූර්තියක්" විකුණන බවයි. විකිණීම අවසන් කිරීමෙන් පසු, විශේෂඥ තක්සේරුවකින් විමුක්ති සොයා ගන්නේ මූර්තිය ජේ.ආර්. ද සිල්වාගේ නොව නොදන්නා කලාකරුවෙකුගේ බවත්, එමඟින් එහි වෙළඳපල වටිනාකම ඔහු විශ්වාස කළ ප්‍රමාණයට වඩා සැලකිය යුතු ලෙස අඩු වන බවත්ය.

වැරදීම නිසා කොන්ත්‍රාත්තුව අවලංගු කළ හැකිද යන්න පිළිබඳව විමුක්තිට උපදෙස් ලබා දෙන්න.

**(ලකුණු 12)**

**ආ)** පහත සඳහන් ඕනෑම එකක් (01) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

I. *Victoria Laundry (Windsor) Ltd v Newman Industries Ltd* [1949] 2 KB 528
*වික්ටෝරියා ලෝන්ඩ්‍රි ( වින්ඩ්සර් ) ලිමිටඩ් එ නිවුමන් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් ( 1949 ) 2 KB 528*

II. *Allcard v. Skinner* [1887] 36 Ch D 145
*ඇල්කාඩ් එ ස්කිනර් [1887] 36 Ch D 145*

III. *Hadley v Baxendale (1854) 9 Exch 341*
*හැඩ්ලි එ බැක්සේන්ඩලේ ( 1854 ) 9 Exch 341*

**( ලකුණු 08 යි )**

**( 12 + 08 = ලකුණු 20 යි )**

*** හිමිකම් ඇවිරිණි ***